බ.කො.ජ චක්‍රලේඛ අංක 10/2016

මගේ අංක:- බ.කො.(බු.ආ)/25/2016

බන්ධනාගාර මූලස්ථානය

කොළඹ 09

2016.02.01

සියළුම බන්ධනාගාර අධිකාරී / සහකාර බන්ධනාගාර අධිකාරී,

**<u>සිර/සැකකරුවන් පැනයාම.</u>**

අධිකරණ නියෝග මත රක්ෂිත බන්ධනාගාර ගත කරන හෝ සිර දඬුවම් ලබා බන්ධනාගාර ගත කරනු ලබන පුද්ගලයන් බන්ධනාගාර අත්අඩංගුවෙන් පැනයාම මේවන විට බරපතල ප්‍රශ්නයක් වී ඇත. එසේම එය සමාජ ආරක්ෂාවටද තර්ජනයක් වී ඇත. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමාජ ආරක්ෂාව පිළිබඳව ප්‍රමුඛතාව සලකා ක්‍රියා කල යුතුවේ. ඒ අනුව සිරකරුවන් බන්ධනාගාර වලින් පිටතට ගැනීමේදී පහත උපදෙස් පිළිපදින ලෙස දැනුම් දෙමි.

01. සිර / සැකකරුවන් ආරක්ෂණය කිරීමේදී ප්‍රමාණවත් පරිදි නිලධාරීන් යෙදවීම සිදුකල යුතුය.

02. එසේම තාක්ෂණික දෝෂ වලින් තොර මාංචු දම්වැල් නිලධාරීන්ට ලබාදීම සිදුකල යුතු අතර, නිලධාරීන්ද එම මාංචු දම්වැල් නිසි පරිදි පරීක්ෂාකර සිරකරුවන්ට යෙදවීම සිදුකල යුතුය.

03. ආයතන වලින් ශ්‍රමදාන ලබාදීම සිදු කිරීමේදී එක් ආයතනයකින් මසකට ශ්‍රම දාන දෙකකට වඩා ඉල්ලීම සිදු නොකල යුතුය. ශ්‍රමදාන සඳහා කරනු ලබන ඉල්ලීම් අනිවාර්යෙන්ම සතියකට පෙර ඉල්ලා අනුමැතිය ලබා ගතයුතුය. ශ්‍රමදාන ලබා දීමේදී රාජ්‍ය ආයතන වලට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

04. ශ්‍රමදාන සඳහා සිරකරුවන් වරකට උපරිම 10 කට වඩා නොයැවිය යුතුය. ශ්‍රමදාන යැවීමේදී හා රැගෙන ඒමේදී අනිවාර්යෙන්ම ආවරණ සහිත රථයක් භාවිතා කල යුතුය. කිසිදු අවස්ථාවක ප්‍රමාණවත් නිලධාරීන් නොමැතිනම් ශ්‍රමදාන නොයැවිය යුතුය.

05. බන්ධනාගාර පරිශ්‍රයේ ඇති නිල නිවස , ආපන ශාලා , බැරැක්ක ආදී අනෙකුත් ස්ථාන වලට සිරකරුවන් සේවයේ යෙදවීමේදී එක් නිලධාරියෙකුට ලබා දිය හැකි උපරිම සිරකරුවන් ප්‍රමාණය තුන්දෙනෙක් පමණ විය යුතුය. තිංදෙනෙකුට වඩා යොදවන්නේ නම් ඔවුන් පැන නොයන බවට අධිකාරීවරයා වගකීම ගත යුතුවේ.

06. එළිමහන් සිරකඳවුරු වල සේවය කරන සිරකරුවන් පැනයාමද වලක්වා ගැනීමට එහි අධිකාරීවරයා කටයුතු කල යුතුය. එක් වගා අංශයක් හෝ කර්මාන්ත අංශයක් වෙත රැගෙන යන සිරකරුවන් පාලනය කිරීමට සහ අධීක්ෂණයට ප්‍රමාණවත් නිලධාරීන් යෙදවිය යුතුයි. එසේම එළිමහන් සිරකඳවුරු වල වුවද කිසිදු සිරකරුවෙකු නිලධාරීන්ගේ අධීක්ෂණයකින් තොරව ආයතන තුල සැරිසැරීමට ඉඩ දීම සිදු නොකල යුතුය. කිසිවිටෙකත් අධීක්ෂණය කිරීමට නොහැකි තරම් සිරකරුවන් බාර නොදිය යුතුය.

07. වැඩ සඟන සඳහා සිරකරුවන් යෙදවීමේදී සිරකරුවන් අධීක්ෂණයට ප්‍රමාණවත් විශ්‍රාමික නිලධාරීන් යෙදවිය යුතුය.

08. සිරකරුවන් පැනයාම වලක්වා ගැනීමට ආයතන අධිකාරීවරයා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. පැනයාමට අවධානමක් ඇති හෝ විශ්වාසවන්ත භාවය අඩු සිරකරුවන් බන්ධනාගාරයෙන් පිටත හෝ සිරකඳවුරු වල සේවයේ නොයෙදිය යුතුය.

09. බාහිර රෝහල් වල ප්‍රතිකාර ලබන සිර/සැකකරුවන් පැනයාම් බහුල කරුණක් බව නිරීක්ෂණය වන අතර නිලධාරීන් නිසිලෙස රාජකාරී සිදුනොකරන බව බොහෝ පැනයාම් වලදී හඳුනා ගත හැකි කරුණක්වේ. එබැවින් රෝහල් සඳහා සිර/සැකකරුවන් ඇතුලත් කිරීමේදී නියමිත ආරක්ෂණ උපක්‍රම භාවිතා කිරීමටත් ප්‍රමාණවත් නිලධාරී යෙදවීමටත් බන්ධනාගාරයේ වගකීම වේ. එසේම රෝහල් ගත කරන ලද සිර/සැකකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධව ජේලර්වරුන් නිසි ලෙස අධීක්ෂණය කරනවාද යන්න අධිකාරීවරයා හා ප්‍රධාන ජේලර්වරයා නිරන්තරයෙන් පරීක්ෂා කල යුතුය.

10. සිරකරුවන් පිටත වැඩකණ්ඩායම් සඳහා සේවයේ යෙදවීමට අනුමත කිරීමේදී අධිකාරිවරයා විනය අංශයේ ජේලර් හා පුනරුත්ථාපන නිලධරියා විසින් සෑහීමට පත් වී යෝජනා කරන්නාවූත්, ප්‍රධාන ජේලර් විසින් නිර්දේශ කරන්නාවූත් සිරකරුවන් පමණක් පිටත වැඩ කණ්ඩායම් වලට අනුමත කල යුතුය. ඒ සඳහා මේ සමග ලබාදී ඇති ආකෘති පත්‍රය භාවිතා කල යුතුය. එම ආකෘති පත්‍රය සිරකරුගේ ගොනුවේ නොගැලවෙන සේ අමුණා තැබිය යුතුය.

11. ආයතන භාර අධිකාරිවරු තම ආයතනයේ සිර/සැකකරුවන් පැනයාම් වලක්වා ගැනීමට අවශ්‍ය සියළු කටයුතු කල යුතුය. ප්‍රමාණවත් නිලධාරීන් නොයෙදවා කරනු ලබන ආරක්ෂණ වලදී සිර/සැකකරුවන් පලායාම් සිදුවුවහොත් එහි වගකීම ආයතන ප්‍රධාන ජේලර් හා අධිකාරී විසින් දැරිය යුතුවේ.

එච්.එම්.එන්.සී.ධනසිංහ

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

## සිරකරුවන් පිටත වැඩ කණ්ඩායම් වලට යොමු කිරීම.

1. සිරකරුගේ අංකය :
2. සිරකරුගේ නම :
3. වරද :
4. දඬුවම් කාලය :
5. දඬුවම් කල දිනය :
6. නිදහස් වන දිනය :
7. බන්ධනාගාර ගතවී ඇති වාර ගනන:
8. පුනරුත්ථාපන නිලධාරි

පුනරුත්ථාපනයට ඇති නැඹුරුව

| අයහපත් | සාමාන්‍ය | හොඳයි | ඉතා හොඳයි |
|---|---|---|---|
| | | | |

කරුණු වටහා ගැනීම හා ප්‍රතිචාර දැක්වීම

| අයහපත් | සාමාන්‍ය | හොඳයි | ඉතා හොඳයි |
|---|---|---|---|
| | | | |

ශාරීරික යෝග්‍යතාවය
( වෛද්‍යවරයාට ඉදිරිපත් කර තබන ලද සටහන් ද සැලකිල්ලට ගන්න)

| අයහපත් | සාමාන්‍ය | හොඳයි | ඉතා හොඳයි |
|---|---|---|---|
| | | | |

සිරකරුගේ මානසික තත්වය
( වෛද්‍යවරයාට ඉදිරිපත් කර තබන ලද සටහන් ද සැලකිල්ලට ගන්න)

| අයහපත් | සාමාන්‍ය | හොඳයි | ඉතා හොඳයි |
|---|---|---|---|
| | | | |

වෙනත් කරුණු :......................................................................................................
..........................................................................................................
..........................................................................................................

පිටත වැඩ සඳහා සුදුසු වේ / සුදුසු නොවේ.

.........................................
පුනරුත්ථාපන නිලධාරි
නම:.................................

8. විනය ජේලර්

විනය චෝදනා

| | |
|---|---|
| ඇත | |
| නැත | |
| | |

ලබා ඇති විනය චෝදනා විස්තර

1) ....................................................................................................

2) ....................................................................................................

3) ....................................................................................................

මීට පෙර පැන ගොස් ඇතිද යන්න

| | |
|---|---|
| පැන ගොස් ඇත | |
| පැන ගොස් නැත | |

නිලධාරීන්ගේ අණට කීකරු වීම

| අයහපත් | සාමාන්‍ය | හොඳයි | ඉතා හොඳයි |
|---|---|---|---|
| | | | |

වෙනත් විශේෂ සටහන්

1) ....................................................................................................

2) ....................................................................................................

පිටත වැඩ සඳහා සුදුසුවේ / සුදුසු නොවේ

....................................

විනය ජේලර්

නම :..........................

9. ප්‍රධාන ජේලර්

පිටත වැඩ සඳහා නිර්දේශ කරමි / නොකරමි.

නිර්දේශ නොකරන්නේ නම් නිර්දේශ නොකිරීමට හේතු සටහන් කරන්න.

හේතුව:....................................................................................................

..............................

ප්‍රධාන ජේලර්

10. බන්ධනාගාර අධිකාරී

අනුමත කරමි / අනුමත නොකරමි

විශේෂ සටහන් : ....................................................................................................

....................................................................................................

................................................

බන්ධනාගාර අධිකාරී